සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


මගේ අංකය / எனது இல / My No: DSD/HO/14/SS/11/04/2024

ඔබේ අංකය / உமது இல / Your No: ..........

දිනය / திகதி / Date: 2025.12.11

සමෘද්ධි චක්‍රලේඛ 2025/13

සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම දිස්ත්‍රික් ගණකාධිකාරීවරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් /දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂවරුන්,

සියළුම සමෘද්ධි කළමණාකරුවන්,

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්,

සියළුම සමෘද්ධි මූලස්ථාන කළමණාකරුවන්,

සියළුම විෂයභාර නිලධාරීන්,

**<u>සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල</u>**

**<u>2025.12.31 දිනට ගිණුම් පියවීමේ කටයුතු සිදු කිරීම</u>**

2025.12.31 දිනට ගිණුම් පියවීමේ කටයුතුවලට අදාලව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් සියළුම දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල හා ප්‍රාදේශීය සමෘද්ධි කාර්යාලවල සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ කාර්යන්හි නියුක්ත නිලධාරීන් පහත උපදෙස් අනුගමනය කරමින් අරමුදලට අදාල ගිණුම් පියවීමට සිදු කළ යුතු බව කාරුණිකව දන්වමි.

02. සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ පහත සඳහන් අවස්ථා යටතේ ගිණුම් පියවීමට අදාලව කටයුතු කළ යුතුය.

i. 2023/2025 හා 2024/2026 අධ්‍යයන වර්ෂයන්ට අදාලව 2025 ජනවාරි සිට 2025 අගෝස්තු දක්වා සිප්දොර ශිෂ්‍යත්ව ප්‍රතිලාභ ගෙවීම වෙනුවෙන් දිස්ත්‍රික් කාර්යාල වෙත නිදහස් කරන ලද මුදල්

ii. 2023/2025 හා 2024/2026 අධ්‍යයන වර්ෂයන්ට අදාළ 2025 සැප්තැම්බර් සිට 2025 නොවැම්බර් දක්වා සිප්දොර ශිෂ්‍යත්ව වාරික සෘජු ප්‍රේෂණ මගින් සමෘද්ධි බැංකු හරහා සිප්දොර ශිෂ්‍යත්වලාභී දරුවන්ගේ ගිණුම් වලට බැර කිරීමට නිදහස් කරන ලද මුදල්

iii. නව සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන (One Village One Product) වැඩසටහන හා ප්‍රජා සවිබලගැන්වීමේ ජාතික වැඩ සටහන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා 2025 වර්ෂයේ දිස්ත්‍රික්ක වෙත නිදහස් කරන ලද මුදල්

03. 2024/2026 අධ්‍යයන වර්ෂයන්හි  දෙසැම්බර් මාසයට අදාළ සිප්දොර ශිෂ්‍යත්ව වාරික මුදලින් තවදුරටත් ගෙවිය යුතු මුදල හා 2025/2027 අධ්‍යයන වර්ෂයට අදාලව 2025 අගොස්තු සිට 2025 දෙසැම්බර් දක්වා වූ හිඟ වාරික මුදලින් තවදුරටත් ගෙවිය යුතු මුදල හැර 2025 වර්ෂයට අදාළව දැරිය යුතු වෙනත් කිසිදු වියදමක් වෙනුවෙන් 2026 වර්ෂය තුල ගෙවීම් සිදු නොකරන බව ද දැනුම් දෙමි.

**04. මුදල් පොත පියවීම, ඉතිරි මුදල් ආපසු භාරදීම හා වියදම් වර්ගීකරණ වාර්තා ඉදිරිපත් කිරීම**

**04-1 ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ගෙවීම් කටයුතු අවසන් කර ගිණුම් පියවීම.**

i. සියළුම ප්‍රාදේශීය සමෘද්ධි කාර්යාල විසින් 2025.12.20 වන විට සමෘද්ධි සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2023/2025 හා 2024/2026 අධ්‍යයන වර්ෂයන්ට අදාලව 2025 ජනවාරි සිට 2025 අගෝස්තු දක්වා සිප්දොර ශිෂ්‍යත්ව ප්‍රතිලාභ ගෙවීම් මේ වන විට අදාළ ශිෂ්‍යත්වලාභි දරුවන් වෙත ගෙවීම් කර තවදුරටත් යම් මුදල් ප්‍රමාණයක් ඉතිරව ඇත්නම්, 2025.12.26 දිනට ප්‍රථම එම මුදල් දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන නිල ගිණුම් වෙත බැර කල යුතු වේ.

ii. 2023/2025 හා 2024/2026 අධ්‍යයන වර්ෂයන්ට අදාළ 2025 සැප්තැම්බර් සිට 2025 නොවැම්බර් දක්වා සිප්දොර ශිෂ්‍යත්ව වාරික සෘජු ප්‍රේෂණ මගින් සමෘද්ධි බැංකු හරහා සිප්දොර ශිෂ්‍යත්වලාභි දරුවන්ගේ ගිණුම් වලට බැර කිරීමට කටයුතු සිදු කර ඇති බැවින්, අදාළ මුදල් සියල්ල ප්‍රතිලාභී දරුවන්ගේ ගිණුම් වලට බැර වී ඇති බව බැංකු මට්ටමින් තහවුරු කර දිස්ත්‍රික් කාර්යාලය වෙත වාර්තා කල යුතුවේ.

යම් විශේෂ හේතුවක් මත යම් මුදල් ප්‍රමානයක් කුමන හෝ බැංකුවක අදාල ප්‍රතිලාභි දරුවාගේ ගිණුමට බැර නොකර රඳවා ගෙන ඇත්නම්, එම ප්‍රතිලාභි දරුවන්ගේ තොරතුරු සමඟ නොගෙවීමට හේතු වූ විශේෂ කරුණුද සඳහන් කර, දිස්ත්‍රික් කාර්යාලය වෙත වාර්තා කළ යුතු අතර අදාල මුදල 2025.12.26 දිනට ප්‍රථම දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන නිල ගිණුම් වෙත බැර කල යුතු වේ.

iii. නව සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන (One Village One Product) වැඩසටහන හා ප්‍රජා සවිබලගැන්වීමේ ජාතික වැඩ සටහන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා 2025 වර්ෂයේ දිස්ත්‍රික්ක වෙත නිදහස් කරන ලද මුදල්  සියල්ල අදාල ව්‍යාපෘති සඳහා යොදවා ගත් බවට ප්‍රාදේශිය ලේකම්ගේ සහතිකය සමඟ  දිස්ත්‍රික් කාර්යාල වෙත වාර්තා කළ යුතුය.

උක්ත ව්‍යාපෘති සඳහා ලබාදෙන ලද මුදලින් යම් මුදල් ප්‍රමාණයක් ඉතිරිව ඇත්නම්, ඊට හේතුව ද සඳහන් කර, එම මුදල  2025.12.26 දිනට ප්‍රථම දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන නිල ගිණුම් වෙත බැර කල යුතුය.

iv. 2025 වර්ෂය තුල අවස්ථා දෙකකදී ලිපිද්‍රව්‍ය සඳහා අත්තිකාරම් මුදල් ලබා දී ඇති අතර පළමු අදියර යටතේ ලබා දෙන ලද අතිකාරම් මුදල් සියලුම දිස්ත්‍රික්ක මේ වන විට පියවා ඇත. දෙවන අදියර යටතේ ලබා දෙන ලද ලිපිද්‍රව්‍ය අත්තිකාරම් මුදල පියවීමට කටයුතු සිදු කල යුතු අතර යම් මුදලක් ඉතිරිව ඇත්නම් නම් 2025.12.20 දිනට ප්‍රථම දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන නිල ගිණුම් වෙත බැර කල යුතු වේ.

ප්‍රාදේශීය සමෘද්ධි කාර්යාල 2025.12.26 දිනට මුදල් පොතේ ශේෂය ගණනය කිරීමේදී ඉහත සඳහන් සියළු ගෙවීම් සිදු කර ඇති බවට තහවුරු කල යුතු අතර අනාවරණය කර ගත් ගිණුම් දෝෂයක් වේ නම් ඒවා නිරවුල් කිරීම් සහ බැංකු සැසඳුම් මඟින් අනාවරණය වී ඇති මුදල් පොතේ ශේෂයට බලපාන ගණුදෙනු වේ නම් ඒවා සියල්ල නිවැරදිව ගැලපුම් කළ යුතුය.

2025.12.31 දිනට ප්‍රාදේශීය සමෘද්ධි කාර්යාලයේ සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ නිල ගිණුමේ මුදල් පොත ශුන්‍ය විය යුතු අතර, කිසිදු ආකාරයකින් එම ගිණුමෙහි මුදල් රඳවා ගැනීමක් සිදු වී නොමැති බවට ප්‍රාදේශීය සමෘද්ධි කාර්යාලයේ වග කිව යුතු නිලධාරීන් මෙන්ම දිස්ත්‍රික් කාර්යාලයේ ගණකාධිකාරී හා සමෘද්ධි අධ්‍යක්ෂ විසින් ද වග බලා ගත යුතු බවට අවධාරණය කරමි.

**4-2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලට අදාල ගෙවීම් කටයුතු අවසන් කර ගිණුම් පියවීම.**

i. 2025 වර්ෂය තුල අවස්ථා දෙකකදී ලිපිද්‍රව්‍ය සඳහා අත්තිකාරම් මුදල් ලබා දී ඇති අතර පළමු අදියර යටතේ ලබා දෙන ලද අතිකාරම් මුදල් සියලුම දිස්ත්‍රික්ක මේ වන විට පියවා ඇත. දෙවන අදියර යටතේ ලබා දෙන ලද ලිපිද්‍රව්‍ය අත්තිකාරම් මුදල පියවීමට කටයුතු සිදු කල යුතු අතර යම් මුදලක් ඉතිරිව ඇත්නම් නම් 2025.12.27 දිනට ප්‍රථම පෙර ගිණුම් අංක 2323330 දරන ලංකා බැංකුව, බත්තරමුල්ල ශාඛාවේ සමෘද්ධි භාරකාර අරමුදල අංක 02 ගිනුමට බැර කල යුතු වේ.

ii. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය විසින් මුදල් පොතේ ශේෂය ගණනය කිරීමේදී නිකුත් කර ඇති සියළු අත්තිකාරම් නිරවුල් වී ඇති බවත්, අනාවරණය කර ගත් ගිණුම් දෝෂයක් වේ නම් ඒවා නිවැරදි කිරීම් හා බැංකු සැසඳුම් මඟින් අනාවරණය වී ඇති මුදල් පොතේ ශේෂයට බලපාන කරුණු වේ නම්, ඒවා සියල්ල ගැලපුම් කර ඇති බවටත් සෑහීමකට පත්විය යුතුය. තවද නිල ගිණුමට අදාල මුදල් පොත තුලනය කර ශේෂය ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය කිරීමේදී අදාල චෙක්පත 2024.12.31 දිනට හෝ එදිනට පෙර මුදල් පොතට ඇතුලත් කිරීමට හැකිවන සේ ගෙනවිත් භාරදීම හෝ ප්‍රධාන කාර්යාලීය ගිණුමට සෘජුව තැන්පත් කර බැංකු තැන්පතු කුවිතාන්සියේ පිටපතක් හා චෙක්පතෙහි පිටපතක් ද ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල වෙත එවීමට කටයුතු කළ යුතු වේ.

iii. නියමිත දිනට ගිණුම් පියවීමෙන් පසු දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය විසින් සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලට අදාල පහත සඳහන් වාර්තා හා ලේඛන 2025.12.31 දිනට හෝ එදිනට පෙර ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.

1. ආවරණ ලිපිය.
2. 2025.12.31 දිනට වියදම් වර්ගීකරණ වාර්තාව ( ඇමුණුම් 01)
3. සිප්දොර ශිෂ්‍යත්ව ගෙවීම් සාරාංශ වාර්තාව - අධ්‍යයන වර්ෂය අනුව (ඇමුණුම් 02)
4. නව සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන (One Village One Product) වැඩසටහන / ප්‍රජා සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති සාරාංශ වාර්තාව (ඇමුණුම 03)

05. මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කර නියමිත දිනයන්ට ගිණුම් පියවීමේ කටයුතු අවසන් කිරීම සඳහා අදාල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටින අතර, වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සඳහා පහත සඳහන් කර ඇති නිලධාරීන් ඉදිරියෙන් දක්වා ඇති දුරකථන අංක ඔස්සේ ඇමතීම මඟින් ලබා ගත හැකි බව දන්වමි.

| | | |
|---|---|---|
| ගණකාධිකාරි (සමාජ සංවර්ධන භාරකාර අරමුදල) | - | 011-2864398 |
| චම්පා ඕපාත මහත්මිය, සමෘද්ධි කළමනාකරු | - | |

06. මෙම කටයුතු වෙනුවෙන් ඔබ ඇතුළු සියළු නිලධාරීන්ගෙන් ලැබෙන සහාය ඉතා අගය කොට සලකමි.

සී.ඩී. කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
2. විගණකාධිපති - කා.දැ.ගැ.පි.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.